# 14

# සුත්ත නිපාතයේ ඉපැරණි භාෂා ලක්ෂණ

අනුරාධපුර
ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ
ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයන අංශයේ
**කථිකාචාර්ය පූජ්‍ය පහළගම ධම්මික ස්ථවිර**

---

සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් කෘතියකි, සුත්ත නිපාතය. මෙහි ගද්‍ය හා පද්‍ය යන දෙඅංශයෙන් පමණක් නො ව, ගද්‍ය පද්‍ය මිශ්‍ර වූ සූත්‍ර දේශනාත් අන්තර්ගත වෙයි. සූත්‍ර හැත්තෑවක් මෙහි අන්තර්ගත වෙයි. සුත්ත නිපාතය සූත්‍ර බෙදා දැක්වීම සඳහා වග්ග පහකට ග්‍රන්ථය කොටස් කොට තිබේ. එම වග්ග නම්,

1. උරග වග්ගය
2. චූල්ල වග්ගය
3. මහාවග්ගය
4. අට්ඨක වග්ගය
5. පාරායන වග්ගය වශයෙනි.

වේද ග්‍රන්ථ පරිශීලනය වූ යුගය වෛදික යුගය වශයෙන් හඳුන්වයි. ඍග්, යජුර්, සාම හා අථර්වන් යන වේද ග්‍රන්ථ මෙම යුගයේ දී භාවිත විය. පුරාණ ඉන්දු ආර්ය භාෂා යුගය වශයෙන් භාෂා ඉතිහාසය හැදෑරීමේ දී මෙකී යුගය නම් කොට තිබේ. ක්‍රි. පූ. 600 දක්වා වූ කාල පරාසය වෛදික යුගයට අයත් වෙයි. එහි දී වේද, බ්‍රාහ්මණ, අරණ්‍යක හා උපනිෂද් යුගවලට අයත් කෘතීන්හි දක්නට ඇති භාෂා ලක්ෂණ සුත්ත නිපාතය හා ජාතකපාළි වැනි

කෘතිවල හමු වෙයි. ලෞකික සංස්කෘතයෙහි විද්‍යමාන නොවන නමුත් වෛදික සංස්කෘතයෙහි හමු වන ඉපැරණි භාෂා ලක්ෂණ පාලියේ දී දක්නට ලැබේ. එකී ලක්ෂණ සුත්ත නිපාතයේ හමු වෙයි.

- අකාරාන්ත නාම පදවල තෘතියා බහුවචනාන්තය භිස් ප්‍රත්‍යාන්ත ව යෙදීම දක්නට ලැබෙයි. මෙකී ලක්ෂණය ලෞකික සංස්කෘතයේ දී දක්නට නො ලැබෙයි. ලෞකික සංස්කෘතයේ දී බුද්ධෛඃ, දෙවෛඃ ආදී වශයෙන් යෙදෙයි. වෛදික සංස්කෘතයේ දී බුද්ධෙභිස්, දෙවෙභිස් යනුවෙන් යෙදෙයි. එම ලක්ෂණය පාලියට පරිණාමය වීමේ දී තතියා බහුවචනාන්තය යෙදෙන්නේ බුද්ධෙභි, බුද්ධෙහි, දෙවෙභි, දෙවෙහි යනුවෙනි.

- වෛදික භාෂාවේ තුමන්ත ක්‍රියාරූප සාධනය තවෙ, තායෙ, තවෛ යන ප්‍රත්‍යයන් තුළින් සකසා ගනී. පාලියෙහි තුමන්ත ක්‍රියාපද එකී ලක්ෂණයෙන් යුක්ත ව දක්නට ලැබේ.

  'දක්ඛිතායෙ අපරාජිතසඞ්ඝන්ති'[1]

  දාතෙව[2]

- වෛදික භාෂාවේ වර්තමාන කර්තෘ කාරක පරස්මෛපද උත්තම පුරුෂ බහුවචනය 'මසි' ප්‍රත්‍යාන්ත ව යෙදෙයි. පාලියෙහි මෙසේ ප්‍රත්‍යාන්ත ව යෙදෙයි.

  'චරාමසෙ' 'භවාමසෙ'[3] කර්තෘ කාරක උත්තම පුරුෂය බහුවචනය මෙම ක්‍රියාරූප පාලියෙහි යෙදෙන්නේ චරාම,[4] භවාම[5] යනුවෙනි.

- අතීත කෘදන්ත ප්‍රථමා විභක්ති බහුවචනය 'ආසස්' ප්‍රත්‍යයෙන් අවසන් වීම වෛදික භාෂාවේ ලක්ෂණයකි. පාලියෙහි 'ආසෙ' යනුවෙන් යෙදී ඇති අවස්ථා ඇත.

  'චුතාසෙ'[6] 'සික්ඛිස්සාමසෙ'[7]

- අකාරාන්ත නාමපදවල තතියා විභක්ත්‍යන්ත ඒකවචනාන්ත පද ආකාරාන්ත ව සිටීම වෛදික භාෂා ලක්ෂණයකි. එය පාලියේ දී,

  'සහත්ථා'[8]

- වෛදික භාෂාවේ දී ප්‍රථම පුරුෂ බහුවචනය 'රෙ' ප්‍රත්‍යයෙන් අවසන් වෙයි. මෙම ලක්ෂණය පාලියෙහි ද හමු වෙයි.

  'පිටියරෙ'[9]

- වෛදික භාෂාවේ උක්ත පුරුෂ බහුවචනාන්තය උකාරාන්ත ව යෙදෙයි. පාලියෙහි එකී ලක්ෂණය දක්නට ලැබේ.

  'ජානෙමු'[10] මෙහි පාලියේ භාවිතය 'ජානාම' යනුවෙනි.

- ස්වර මධ්‍යගත ව පවතින විට ඩ, ඪ යන අක්ෂර දෙක වෛදික භාෂාවේ දී ළ, ළ්හ බවට පත්වෙයි. එකී ලක්ෂණය පාලියෙහි ද දක්නට ලැබේ.

  'තඩාග > තළාග'

  'දෘඪ > දළ්හ'[11]

වෛදික භාෂා ලක්ෂණ සුත්ත නිපාතයේ යෙදීමෙන් පැහැදිලි වන්නේ සුත්ත නිපාත ඉපැරණි දේශනා ඇතුළත් කෘතියක් බව යි. මෙහි අට්ඨක හා පාරායන වග්ග දෙක තුළ ඉපැරණි ම භාෂා ලක්ෂණ බෙහෙවින් දක්නට ලැබේ. ඊට අමතර ව ප්‍රාකෘත භාෂා ලක්ෂණ මෙහි දක්නට ලැබේ. පාලි භාෂාව මධ්‍ය ඉන්දු ආර්ය භාෂා යුගයට අයත් භාෂාවකි. ප්‍රාකෘත භාෂා යුගය වශයෙන් වාග් විද්‍යාඥයන් සළකන්නේ ක්‍රි. පූ. 600 සිට ක්‍රි. ව. 1000 දක්වා වූ කාල පරිච්ඡේදය යි. එය ප්‍රාකෘත භාෂා යුගය වෙයි. එහි දී මහාරාෂ්ට්‍රි, සෞරසේනි, පෛශාචි, මාගධී, අපභ්‍රංශ වැනි භාෂා බෙහෙවින් භාවිත වී ඇත. ප්‍රාකෘත භාෂාවේ කඨෝර අක්ෂර නැත. සුලලිතවත් සුඛනම්‍ය භාෂාවක් වෙයි. අක්ෂර මාලාව දෙස පොදුවේ බැලූ විට පාලි හා ප්‍රාකෘත භාෂා දෙකේ ම ඍ, ඎ, ඏ, ඐ, ඓ, ඖ, විසර්ගය, ශ, යනාක්ෂර දක්නට නැත. එම අක්ෂර වෙනත් ස්වරූපයකින් මෙම භාෂාවලට පරිණාමය සිදු වී ඇත.

- ඍකාරය පාලියට පැමිණීම.

  මෘග - මිග

  මෛත්‍රී - මෙත්තා

  ඖෂධ - ඔසධ

පුරාණ යුගයෙන් මධ්‍යතන යුගයට භාෂාව පරිණාමය වීමේ දී කඨෝර අක්ෂර ක්‍රමයෙන් ලිහිලීකරණය හා සුඛනම්‍යතාව සිදු වූ අයුරු දැක ගත හැකි ය.

- හලන්ත ශබ්ද පාලි හා ප්‍රාකෘත භාෂා දෙකේ ම අභාවයට ගොස් තිබේ.

  'රාජන් - රාජ'[12]

  'ප්‍රතිපද් - පටිපදා'[13]

- ද්විවචනය අභාවයකට යාම පාලි හා ප්‍රාකෘත භාෂා දෙකේ ම දක්නට ඇති ලක්ෂණයකි.
- චතුර්ථී හා ෂෂ්ඨී විභක්ත්‍යන්ත රූප සමාන වීම භාෂා දෙකේ ම දක්නට ලැබේ.

  'බුද්ධාය, බුද්ධස්ස, බුද්ධානං'

- පඤ්චමී හා සත්තමී ක්‍රියාරූප බහුල වශයෙන් පාලි හා ප්‍රාකෘත යන භාෂා දෙකේ යෙදෙයි.
- ආත්මනේ පද ක්‍රමයෙන් අභාවයට යාම.
- අවසාන ක්‍රියා වෙනුවට අතීත කෘදන්ත පද බහුල ව භාවිත වීම.
- සංස්කෘත භාෂාවේ අකාරාන්ත පුරුෂ ලිංග නාමපදවල ප්‍රථම පුරුෂ ඒක වචනාන්තය විසර්ගාන්ත ව යෙදෙයි. එය ඕකාරාන්ත ව යෙදීම පාලි හා ප්‍රාකෘත භාෂා දෙකේ ම දක්නට ලැබෙයි.

  'දෙවඃ - දෙවො'

  'බ්‍රාහ්මණඃ - බ්‍රාහ්මණො'[14]

සුත්ත නිපාතයේ වෛදික භාෂා ලක්ෂණ යම් ප්‍රමාණයකට සොයා ගත හැකි ය. එයට වේද යුගයේ භාෂාත්මක බලපෑම පෙන්වා දිය හැකි ය. මධ්‍ය යුගයේ භාෂා ලක්ෂණ වන ප්‍රාකෘත භාෂා ලක්ෂණ මෙහි විටින් විට හමුවෙයි. ත්‍රිපිටක ග්‍රන්ථ අතර පැරණි භාෂා ලක්ෂණවලින් හෙබි කෘතියක් සේ සුත්ත නිපාතය සඳහන් කිරීමට පුළුවනි.

## ආන්තිකසටහන්

1. පරමත්ථජෝතිකා නාම සුත්තනිපාතට්ඨකථා, සම්මා පරිබ්බාජනීය සුත්ත වණ්ණනා,

2. සුත්ත නිපාතය, බ්‍රාහ්මණ ධම්මික සූත්‍රය, 88 පි. යංතෙසංපකතං ආසි - නිහිරඤ්ඤං ධානියං, සද්ධාපකත මෙසානං - දාතවෙ තදමඤ්ඤිසු.

3. එම, ධනිය සූත්‍රය, 10 පි. ගොපී ච අහං ච අස්සවා - බ්‍රහ්මචරියංසුගතෙ චරාමසෙ, ජතිමරණස්සපාරගා - දුක්ඛස්සන්තරා භවාමසෙ. ඛුද්දකනිකාය i කොටස, 34 පි.

   වාරිජො'ව ථලෙඛිත්තතො - ඔකමොකත උබ්බතො,
   පරිපන්දතිදං චිත්තං - මාරධෙය්‍යං පහාතවෙ.

   එම, 23 පි. පරෙචන විජානන්ති - මයමෙත්ථ යමාමසෙ,
   යෙච තත්ථ විජානන්ති - තතො සම්මන්ති මෙධගා.

4. දීඝනිකාය iii කොටස, උදුම්බරික සූත්‍රය, 94 පි. මජ්ඣිම නිකාය iii කොටස, නගරාවින්දෙය්‍ය සූත්‍රය 602 පි. සංයුත්ත නිකාය iii කොටස, උපොසථ සූත්‍රය, 480 පි.

5. ථෙරගාථා පාළි, 256 පි. 1132 ගාථාව. ජාතක පාළි i කොටස, 130 පි. 387 ගාථාව.

6. සුත්ත නිපාතය, ගුහට්ඨක සූත්‍රය, 244 පි. 778 ගාථාව.

   කාමෙසු ගිද්ධා පසුතාප මූළ්හා
   අවදානියා තෙ විසමෙ නිවිට්ඨා,
   භික්ඛූපනීතා පරිදෙවයන්ති
   කිංසු භවිස්සාම ඉතො චුතාසෙ.

   එම, පස්සාමි ලොකෙ පරිඵන්ද මානං
   පජං මම තණ්හාගතං භවෙසු,
   හීනානරා මච්චුමුඛෙ ලපන්ති
   අවීත තණ්හා සෙභවා භවෙසු.

7. එම, තිස්ස මෙත්තෙය්‍ය සූත්‍රය, 258 පි. 818 ගාථාව.

   මෙථුන මනුයුත්තස්ස
   විඝාතං බ්‍රෑහිමාරිස,
   සුත්වාන තව සාසනං
   විවෙකෙ සික්ඛිස්සාමසෙ.

8. එම, සෙල සූත්‍රය, 178 පි. අථ ඛො කෙණියො ජටිලො බුද්ධපමුඛං භික්ඛුසඞ්ගංපණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථාසන්තප්පෙසි සම්පවාරෙසි.

9. එම, අජිත සූත්‍රය, 316 පි. 1038, 1039 ගාථා.

සවන්ති සබ්බධි සොතා
සොතානං කිං නිවාරණං,
සොතානං පවරං බ්‍රෑහි
කෙනසොතා පිථීයරෙ.

යානිසොතා නිලොකස්මිං
සතිතෙසං නිවාරණං,
සොතානං සංවරං බ්‍රෑමි
පඤ්ඤායෙතෙ පිථීයරෙ.

10. එම, කසීභාරද්වාජ සූත්‍රය, 24 පි. 76 ගාථාව.

කස්සකො පටිජානාහි න ච පස්සාමි තෙ කසිං,
කසිංනො පුච්ඡිතො බ්‍රෑහි යථා ජානෙමු තෙ කසිං.

11. එම, උට්ඨාන සූත්‍රය, 98 පි. 334 ගාථාව.

උට්ඨහථ නිසීදථ දළ්හංසික්ඛථ සන්තියා,
මාවොපමත්තෙ විඤ්ඤාය
මච්චුරාජා අමොසයිත්ථ වසානුගෙ.

12. එම, පබ්බජ්ජා සූත්‍රය, 124 පි. 425 ගාථාව.

ආදිච්චො නාම ගොත්තෙන සාකියා නාම ජාතියා,
තම්හා කුලා පබ්බජිතොම්හි රාජ න කාමෙ අභිපත්ථයං.

13. එම, නාලක සූත්‍රය, 222 පි. 717 ගාථාව.

උච්චාවචාහි පටිපදා සමණෙන පකාසිතා,
න පාරං දිගුනංයන්ති න ඉදං එකගුනං මුතං.

14. එම, වාසෙට්ඨ සූත්‍රය, 186 පි.